බාලවයස් ලිංගික අපයෝජනයක් ද? "අඹු කමට දීමක්" ද?
වයස අවුරුදු 16 ට අඩු දරුවෙකු බාලවයස්කරුවෙකු නැතිනම් බාලවයස්කාරිනියක ලෙසින් සැලකේ. එවැනි බාලවයස් අයෙකුගේ කැමැත්තෙන් වුවත් ලිංගික සබඳතාවයක් පැවැත්වීම, නීතියට අනුව දඬුවම් ලැබිය හැකි වරදකි. එය ලිංගික අපයෝජනයක් ලෙසින් සැලකෙන අතර, නීති වගන්ති වලට අනුව "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්" (දණ්ඩ නීති සංග්‍රහය තුළ "ව්‍යවස්ථාපිත දූෂණයක්") ලෙසින් හැඳින්වේ.
13 හැවිරිදි දැරියක 21 හැවිරිදි තරුණයෙකුට "අඹුකමට තබාගැනීමට" ඉඩ දීම හේතුවෙන්, එම තරුණයා, තරුණයාගේ දෙමාපියන් සහ දැරියගේ දෙමාපියන් කුලියාපිටිය පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුණු බව දිනමිණ පුවත් වාර්තාවක් (පෙබ. 22, 2023) පවසයි.
එම පුවතේ සිරස්තලය මෙසේයි."දහතුනේ දැරිය විසිඑකේ තරුණයාට අඹුකමට දුන් මවුපියෝ අත්අඩංගුවට"
1) නීතියට අනුව මෙවැනි සිදුවීමක් බාලවයස් අයෙකුගේ කැමැත්තෙන් සිදුවූවද වරදක් බව නොදන්නා පාඨකයෙකුට, මෙම සිදුවීමෙහි ඇති බරපතල බව මෙම සිරස්තලය ඔස්සේ වැටහෙනු ඇතිද?
2) ඒ අනුව, මෙම සිරස්තලය මගින් සිදුවූ බවට පැවසෙන අදාළ වරද සැහැල්ලු කොට දැක්වීමක් සිදු වෙතැයි ඔබ නොසිතන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න. *අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

